# ගෘහස්ථ වාණිජ බෝගයක් ලෙස ඉඟුරු වගාව ව්‍යාප්ත කිරීම


වාර්ෂික බෝගයක් වන ඉඟුරු ශාකය නිවර්තන ආසියාවේ උපත ලබා පසුව යුරෝපයට සීඝ්‍රයෙන් සංක්‍රමණය වූ ඉතා දිගු අතීතයක් ඇති පෙරදිග කුළුබඩු බෝගයකි. ඉඟුරු ඖෂධීය ශාකයක් පමණක් නොව, ආහාර රසකාරකයක්, කුළුබඩුවක්, ලෙස මෙන් ම ජින්ජර් බියර් වැනි පාන වර්ග නිෂ්පාදනයට හා අපනයනය සඳහා යොදා ගැනෙයි. මේ නිසා ඉඟුරු සඳහා දේශීය වශයෙන් මෙන් ම විදේශීයව ද විශාල ඉල්ලුමක් හිමි කරගෙන තිබේ.

පරම්පරා ගණනක් තිස්සේ දේශීය වෛද්‍ය ක්‍රමවලින් සුළු රෝගාබාධ සුව කරගැනීම සඳහා ස්වාභාවික ශාක සාර භාවිතයට ශ්‍රී ලාංකික ජනයා හුරු වී සිටිති. මේ සඳහා ඔවුහු සිය ගෙවත්තේ ඖෂධීය ගුණයෙන් යුත් ශාක කිහිපයක් වවා ගැනීමටත් ඒවායෙන් ප්‍රයෝජන ගැනීමටත් හුරු පුරුදු වී සිටිති. සින්ජිබරේසියේ(Zingiberaceae) කුලයට අයත් සින්ජිබර් ඔෆිසිනාලේ (Zingiber Officinale) යන උද්භිද විද්‍යාත්මක නාමයෙන් හඳුන්වනු ලබන ඉඟුරු මෙරට බොහෝ ගෙවතුවල ඖෂධීය ගුණයෙන් යුත් ශාකයක් ලෙස නිතර දැකිය හැකි ය.

ඉඟුරු කන්නයකට වගා කරනු ලබන බෝගයක් වන අතර දේශීය වශයෙන් එය ප්‍රචලිතව ඇත්තේ තෙත් කලාපයේ ගෙවතු බෝගයක් ලෙසිනි. එසේ වුව ද, මෙම බෝගය තනි වගාවක් ලෙසත්, පොල්, කෙසෙල්, ගම්මිරිස් වැනි බෝග අතර අතුරු බෝගයක් ලෙසත් වගා කරයි. ඉඟුරු අතුරු බෝගයක් ලෙස මහා පරිමාණයෙන් කුරුණෑගල, ගම්පහ, මහනුවර, කෑගල්ල හා කළුතර යන දිස්ත්‍රික්කවල වගා කෙරේ.

ප්‍රස්ථාර අංක 1 ට අනුව 2009 වසර වන විට ශ්‍රී ලංකාව තුළ ඉඟුරු වගා කරන ඉඩම් ප්‍රමාණයේ වැඩිවීමේ ප්‍රවණතාවයන් පෙන්නුම් කරයි. 2000 වසරේ දී හෙක්ටයාර 1492ක් ව තිබූ මුළු ඉඩම් ප්‍රමාණය 2009 වර්ෂය වනවිට හෙක්ටයාර 1892 දක්වා 26.8% කින් වර්ධනය වී තිබේ.


ශ්‍රී ලංකාවේ ඉඟුරු වගා ව්‍යාප්තිය




මූලාශ්‍රය: ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව, 2009

ප්‍රස්ථාර අංක - 1

ශ්‍රී ලංකාවේ ඉඟුරු වගා කරන ඉඩම් ප්‍රමාණයන්(හෙක්ටයාරවලිනි)





මූලාශ්‍රය: ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව, 2009

ශ්‍රී ලංකාව තුළ වගා කරන මුළු ඉඩම් ප්‍රමාණයෙන් වැඩි භූමි ප්‍රමාණයක් ඉඟුරු වගාවට අදාළ වන්නේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ වේ. කුරුණෑගල, ගම්පහ, මහනුවර, කෑගල්ල හා කළුතර යන දිස්ත්‍රික්කවල ප්‍රධාන වශයෙන් ම ඉඟුරු වගා කරන අතර අනෙකුත් දිස්ත්‍රික්කවල ඉතා සුළු වශයෙන් ඉඟුරු වගාව ව්‍යාප්ත වී පවතී.

වර්තමානය වන විට ශ්‍රී ලංකාව තුළ ඉඟුරු නිෂ්පාදනය ඉතා සීඝ්‍ර ලෙස වැඩිවීමක් සිදු වී ඇති අතර 2000 වර්ෂයට සාපේක්ෂව 2009 වසරේ 96.8% ක වර්ධනයක් පෙන්නුම් කරයි. ප්‍රස්ථාර අංක 1 මගින් පසුගිය ගිය වසර 10ක කාලය තුළ දිස්ත්‍රික් වශයෙන් ඉඟුරු වගා නිෂ්පාදනය දක්වන අතර මහනුවර හා ගම්පහ යන දිස්ත්‍රික්කවලින් ඉහළ ඉඟුරු නිෂ්පාදනයක් වාර්තා වී තිබේ.

ප්‍රස්ථාර අංක - 2

**ශ්‍රී ලංකාවේ ඉඟුරු නිෂ්පාදනය - (2000-2009)**




මූලාශ්‍රය: ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව, 2009

වගු අංක - 1

ශ්‍රී ලංකාව තුළ ඉඟුරු වගා නිෂ්පාදනය (මෙට්‍රික් ටොන්)

| දිස්ත්‍රික්කය | 2000 | 2001 | 2002 | 2003 | 2004 | 2005 | 2006 | 2007 | 2008 | 2009 |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| ශ්‍රී ලංකාව | 5477 | 4649 | 5081 | 4843 | 5693 | 6699 | 6755 | 8271 | 10053 | *10780* |
| ගම්පහ | 1270 | 1000 | 1230 | 1327 | 827 | 1237 | 1420 | 1727 | 1578 | *2078* |
| කළුතර | 472 | 433 | 467 | 396 | 589 | 684 | 630 | 542 | 556 | *703* |
| කුරුණෑගල | 882 | 370 | 507 | 428 | 604 | 507 | 660 | 357 | 350 | *237* |
| කෑගල්ල | 1451 | 1405 | 1421 | 1184 | 926 | 815 | 601 | 780 | 1633 | *1764* |
| මහනුවර | 301 | 315 | 406 | 362 | 1102 | 1655 | 1392 | 2288 | 2283 | *2544* |
| *වෙනත්* | *1101* | *1126* | *1050* | *1146* | *1645* | *1801* | *2052* | *2585* | *3653* | *3454* |

**මූලාශ්‍රය: ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව, 2009**

වගු අංක 1 ට අනුව පැහැදිලි වන්නේ, ඉඟුරු වගාව වඩාත් ප්‍රචලිතව පවතින කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ සෙසු දිස්ත්‍රික්කවලට සාපේක්ෂව වැඩි බිම් ප්‍රමාණයක ඉඟුරු වගාව සිදු කළ ද අස්වැන්න අඩු මට්ටමක පවතින බව යි.

2000-2009 දක්වා කාලය තුළ ශ්‍රී ලාංකීය ඉඟුරු නිෂ්පාදන අමු ඉඟුරු, වියළි ඉඟුරු හා ඉඟුරු තෙල් වශයෙන් අපනයනය කොට තිබේ. වගු අංක 2 මගින් අපනයනය කළ ඉඟුරු හා ඉඟුරු තෙල් ප්‍රමාණයන් හා ඒ සඳහා ලැබුණ වටිනාකම පිළිබඳව දත්ත ඉදිරිපත් කොට ඇත.

අවශ්‍යතාවය සම්පූර්ණ කිරීමට තරම් ඉඟුරු ප්‍රමාණයක් දේශීය වශයෙන් නිෂ්පාදනය නො වීම මෙයට ප්‍රධාන හේතුව යි. ඉතා කුඩා ඉඩ ප්‍රමාණයක, අඩු පිරිවැයකින් වගා කළ හැකි බෝගයක් වුව ද මෙරට ජනතාව මෙම බෝගය සාර්ථකව වගා කිරීම සඳහා එතරම් උනන්දුවක් නො දක්වන බව පැහැදිලි වේ.

2009 වසර තුළදී ශ්‍රී ලංකාවේ ඉඟුරු කිලෝග්‍රෑම් එකක් සඳහා ගොවිපළ මිල වශයෙන් රු.102.57 ක් ද තොග මිල ලෙස රු.323.56 ක් වැනි ඉහළ මිලක් ද වාර්තා වී ඇත (මූලාශ්‍රය: ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව).

වගු අංක - 2

**ශ්‍රී ලංකාව ඉඟුරු හා ඉඟුරු තෙල් අපනයනය (2000-2009 දක්වා)**

| වසර | ඉඟුරු | | ඉඟුරු තෙල් | |
|---|---|---|---|---|
| | ප්‍රමාණය (කි.ග්‍රෑ.) | වටිනාකම(රුපියල්) | ප්‍රමාණය (කි.ග්‍රෑ.) | වටිනාකම(රුපියල්) |
| 2000 | 9,570 | 3,699,148 | 49 | 477,785 |
| 2001 | 8,846 | 3,745,327 | 40 | 538,454 |
| 2002 | 6,521 | 3,642,876 | 570 | 2.349,511 |
| 2003 | 14,853 | 7,039,252 | 2,155 | 3,006,421 |
| 2004 | 14.872 | 5,039,227 | 307 | 1,268,352 |
| 2005 | 58,248 | 29,423,759 | 1,646 | 5,237,252 |
| 2006 | 56,110 | 34,413,395 | 933 | 116,380 |
| 2007 | 53,664 | 36,764,698 | 806 | 11,519,659 |
| 2008 | 59,377 | 42,574,724 | 1,849 | 15,410,668 |
| 2009 | 44,761 | 38,712,601 | 1,619 | 5,588,885 |

මූලාශ්‍රය: ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව, 2009

ගෙවී ගිය වසර දහය ඇතුළත ඉඟුරු හා ඉඟුරු තෙල් අපනයනයේ සීඝ්‍ර වැඩිවීමක් පෙන්නුම් කරයි. ඉහළ ම ඉඟුරු ප්‍රමාණයක් 2008 වසරේ දී අපනයනය සිදු කර ඇති අතර 2009 වසරේ දී ඉඟුරු අපනයනයේ සුළු පසු බැස්මක් පෙන්නුම් කරයි. වැඩිම ඉඟුරු තෙල් ප්‍රමාණයක් අපනයනය සිදු කර ඇත්තේ 2003 වසරේදී ය. මෙලෙස ශ්‍රී ලංකාවේ නිෂ්පාදනය කරන ලද ඉඟුරු විදෙස් රටවලට අපනයනය කිරීමක් සිදු කළ ද, ඉඟුරු ආනයනය කිරීමක් ද සිදු වී ඇත. ශ්‍රී ලංකාව අපනයනය කරන ප්‍රමාණයට වැඩි ප්‍රමාණයත් වාර්ෂිකව ආනයනය කරන බව දත්ත අනුව පැහැදිලි වේ.

2000-2009 දක්වා වසර දහයක කාලය තුළ ඉතා අධික ඉඟුරු ප්‍රමාණයක් විදෙස් රටවලින් ආනයනය සිදු කොට තිබේ. ශ්‍රී ලංකාවේ ජාතික

වගු අංක - 3


**ශ්‍රී ලංකාවේ ඉඟුරු ආනයනය (2000-2009)**

| වසර | ඉඟුරු | |
|---|---|---|
| | ප්‍රමාණය (කි.ග්‍රෑ.) | වටිනාකම(රුපියල්) |
| 2000 | 225,535 | 16,285,402 |
| 2001 | 913,328 | 38,445,850 |
| 2002 | 20,590,73 | 80,786,749 |
| 2003 | 1,140,552 | 42,888,805 |
| 2004 | 359,308 | 40,843,483 |
| 2005 | 161,417 | 40,746,031 |
| 2006 | 391,741 | 32,936,641 |
| 2007 | 976,518 | 62,544,434 |
| 2008 | 460,926 | 52,125,017 |
| 2009 | 594,014 | 71,017,874 |

මූලාශ්‍රය: ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව, 2009

ප්‍රස්ථාර අංක - 3

ශ්‍රී ලංකාවේ ඉඟුරු තොග හා නිෂ්පාදන මිල (2000-2009)-කිලෝග්‍රෑමයකට රුපියල්වලින්




මූලාශ්‍රය: ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව, 2009

ප්‍රස්ථාර අංක 3 හි දැක්වෙන ආකාරයට ගොවිපළ මිලට සාපේක්ෂව තොග මිලෙ හි ඉහළ යාම වැඩිවීමක් පෙන්නුම් කරයි. ඒ අනුව අනාගතයේ ඉඟුරු වගාව තුළින් ගොවීන්ට වාසිසහගත තත්ත්වයක් ඇතිවිය හැකි බව අපේක්ෂා කළ හැකි ය.

ගොවියා ගොවිතැනින් ඉවතට තල්ලු වී නො ගොස් වගා කටයුතු ලාභදායී මට්ටමකින් පවත්වා ගෙන යාමට එක ම භූමියේ විවිධ බෝග වර්ග කිහිපයක් වගා කොට වරින් වර අස්වැන්න ලබා ගත යුතු ය. ඒ සඳහා ඉඟුරු සාර්ථක බෝගයක් වේ. මේ අනුව අතීතයේ දී ගෙවතුවල නො සැලකිලිමත් ලෙස ඉතා සුළුවෙන් වගා කර තිබූ ඉඟුරු ශාකය වත්මන් වෙළෙඳ රටාව අනුව වාණිජමය වටිනාකමක් ඇති බෝගයක් බවට පත් වී ඇත. මෙවැනි කුඩා ශාකයක් වගා කිරීම නිසා ශ්‍රී ලාංකික ජනතාවට අත්වන වාසි කිහිපයක් පවතී. එනම් කුඩා ගෙවත්තක වෙනත් කුඩා ඉඩමක වුව ද වැවිය හැකි වීම, වෙනත් වගාවන් අතර වැවිය හැකි වීම, වගාවට වැයවන පිරිවැය අඩුවීම හා වෙළෙඳපොළ ඉල්ලුමක් පැවතීම ඉන් කිහිපයකි.

වර්තමානයේ ඉඟුරු වගාව සඳහා දේශීය හා විදේශීය වශයෙන් ඉල්ලුමක් පැවතිය ද ඒ සඳහා අවශ්‍ය නිෂ්පාදන ප්‍රමාණය දේශීයව සපුරාලීම සඳහා සමත් වී නොමැත. එමෙන් ම, විශාල විදේශ විනිමය ප්‍රමාණයක් ආනයනය වෙනුවෙන් වැය කරන අතර එය වාර්ෂිකව වැඩිවීමක් පවතින බව සංඛ්‍යාලේඛන පිරික්සීමෙන් හඳුනාගත හැකි ය. දේශීයව දියුණු කළ හැකි කෘෂි නිෂ්පාදනයක් මෙසේ ආනයනය කිරීම ද ගැටළු සහගත ය. එදිනෙදා ගෘහස්ථව ප්‍රයෝජනයට ගැනීමට වගා කිරීමෙන් ඔබ්බට ගොස් විදෙස් වෙළෙඳපොළ තුළ ඉහළ ඉල්ලුමක් පවතින මෙම බෝගය එම ඉල්ලුමට සරිලන ලෙස වගා කිරීම අද යුගයේ අවශ්‍යතාවයක් බවට පත් ව තිබේ.


**එස්. ඇපාසිංහ**

*පර්යේෂණ නිලධාරී*

**ඕ.එච්. පිලපිටිය**

*අනියම් විමර්ශන නිලධාරිණී*

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු, පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය.